කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය 2018/2019

**INR 2234 – ජාත්‍යයන්තර සබඳතා තුළ මානව අයිතිවාසිකම්**

කාලය: පැය **දෙකයි (02)**

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එය ඇතුළුව ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.**

1. **සියලු කොටස්** වලට පිළිතුරු සපයන්න
   i. මානව අයිතිවාසිකම් නිර්වචනය කරන්න.
   ii. මානව අයිතිවාසිකම් විස්තර කරන්නාවූ න්‍යායන් දෙකක් (02) නම් කරන්න.
   iii. මානව අයිතිවාසිකම් න්‍යායන් දෙකක් (02) තෝරාගෙන, එම න්‍යායන්ගේ දායකත්වය සාකච්ඡා කරන්න.

2. **එක්කෝ**
   I සදාචාරාත්මක සහ නීතිමය අයිතීන් පිළිබඳව සඳහන් කරමින් මානව අයිතීන් වර්ධනය වූ ආකාරය සාකච්ඡා කරන්න.

   **නැතහොත්**

   II මානව අයිතීන් ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීමෙහිලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (UNO) භූමිකාව විභාග කරන්න.

3. "මානව අයිතිවාසිකම් පිළිබඳ කලාපීය උපකරණ සහ යාන්ත්‍රණයන් නිසා කලාපීයව අයිතිවාසිකම් ආරාක්ෂාවීම සිදු වෙයි." මෙම අදහසට ඔබ කෙතරම් එකඟ ද? උදාහරණ සහිතව ඔබේ පිළිතුර සාකච්ඡා කරන්න.

4. **එක්කෝ**
   I **කොටස් දෙකට (02)** පිළිතුරු සපයන්න
   i. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්වීයවාදය (Universalism) කෙටියෙන් නිර්වචනය කරන්න.
   ii. විශ්වීයවාදය පිළිබඳ විවිධ න්‍යායයන්, මානව අයිතිවාසිකම්හි වටිනාකම් අවධාරණය කරන්නේ කෙසේද යන්න විචාරය කරන්න.

   **නැතහොත්**

   II **කොටස් දෙකට (02)** පිළිතුරු සපයන්න
   i. සංස්කෘතික සාපේක්ෂතාවාදය (Cultural Relativism) කෙටියෙන් නිර්වචනය කරන්න.
   ii. මානව අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී සංස්කෘතික සාපෙක්ෂතාවාදය යෝග්‍යවන්නේ කෙසේද යන්න උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න.

5. "සාමූහික අයිතීන් සහ කණ්ඩායම් අයිතීන් ආරක්ෂා වනුයේ එම සමාජයේ සාමාජිකයන් එක්ව කටයුතු කිරීමෙනි". මෙය සාමූහික සහ කණ්ඩායම් අයිතීන් කඩ වූ සිද්ධි අධ්‍යයනයන් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

6. පහත ඕනෑම **දෙකකට (02)** පිළිබඳ සටහන් ලියන්න.
   i. ජාත්‍යයන්තර මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම්
   ii. මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ ජාර්කාන්ඩ් ව්‍යාපාරය
   iii. පාරිසරික අර්බුදය නිසා මානව අයිතීන් උල්ලංඝනය වීම
   iv. ජාත්‍යයන්තර යුක්ති අධිකරණය (ICJ)

***********************